මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: BD/CBP/01/01/03-2023
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2023.08.04

**ජාතික අයවැය චක්‍රලේඛ අංක: 04/2023**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා/විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**2024 අයවැය කැඳවීම**

**2024 වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශ**

**1. පසුබිම**

1.1 2022 වර්ෂයේ සිට, ශ්‍රී ලංකාව පෙර නොවූ විරූ, ව්‍යසනකාරී, ගැඹුරු අර්බුදයකට මුහුණ පා ඇති අතර, එය දරුණුවූත් දිගුකාලීනවූත් පුළුල් පරාසයකට විහිදී ගිය ආර්ථික, සමාජයීය සහ දේශපාලනික ප්‍රතිවිපාක සඳහා හේතු වී ඇත. අර්බුදය විවිධාකාර ලෙස සමස්ත සමාජයටම බලපා ඇති අතර, විශේෂයෙන් එය දිළිඳු ජනතාව සහ පහසුවෙන් අවදානමට ලක්විය හැකි පුද්ගලයන් හට බලපා ඇත. රජය විසින් ඊට ප්‍රතිචාර වශයෙන්, ස්ථාවරත්වය යළි ඇති කිරීම සහ තිරසාර ආර්ථික වර්ධනය සාක්ෂාත් කිරීම අරමුණු කරගෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ අරමුදල් පහසුකම් වැඩසටහනෙහි සහාය ද සහිතව දැඩි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ආරම්භ කරන ලදී. දීර්ඝ කාලයක් ප්‍රමාද වූ නමුත් අත්‍යවශ්‍ය වන එම ප්‍රතිසංස්කරණ වැඩසටහන මනා කැපවීමෙන් හා අවධානයෙන් යුතුව ක්‍රියාත්මක කළ යුතුව ඇත. ඉහත සඳහන් ප්‍රතිසංස්කරණවල සහාය ද ඇතිව 2022 වර්ෂයේදී කැළඹිලි සහිතවූත් අතිශය අභියෝගාත්මකවූත් කාල පරිච්ඡේදයක් පසු කළ ශ්‍රී ලංකා ආර්ථිකය, පසුබෑස්ම මඟ හරිමින්, බොහෝ අංශ තුළින් ස්ථාවරත්වයේ පෙරනිමිති පෙන්නුම් කරමින්, ක්‍රමික වර්ධනයක් කරා ගමන් කිරීමේ සලකුණු පෙන්වයි.

1.2 කෙසේ වෙතත්, අපේක්ෂිත ප්‍රතිසංස්කරණ මාවතෙන් බැහැරව, අතීතයේදී මෙන් තිරසාර නොවන ප්‍රතිපත්ති සහ භාවිතාවන් වෙත නැවත යොමු වීම සඳහා ඉඩ ප්‍රස්තාවක් කිසිසේත්ම නොමැත. ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම ආරම්භක අවස්ථාවේ පවතින බැවින් සහ එය පහසුවෙන් අවදානමට ලක්විය හැකි බැවින් එවැනි විතැන් වීමක ප්‍රතිවිපාක විනාශකාරී වනු ඇත. එබැවින්, ආර්ථික අර්බුදයක් නැවත ඇතිවීම වැළැක්වීමත්, පූර්ණ වශයෙන් සාක්ෂාත් කර නොගත් ආර්ථික වර්ධන විභවය ප්‍රතිස්ථාපනය කිරීමත් සඳහා වන ව්‍යුහාත්මක බාධාවන් ඉවත් කිරීම උදෙසා වූ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය දැඩි කැපවීමකින් සහ මනා අවධානයෙන් යුක්තව, තරයේ ක්‍රියාත්මක කළ යුතු වේ.

1.3 රාජ්‍ය අයවැයේ ප්‍රාථමික ශේෂය ඇතුළු බොහෝ අංශවල ක්‍රමානුකූල වර්ධනයක් නිරීක්ෂණය වුව ද, රාජ්‍ය මූල්‍ය සම්පත් හිඟකම හා රාජ්‍ය මූල්‍ය අවකාශය සීමිත වීම හේතුවෙන් ප්‍රතිපාදන සඳහා වන ඉල්ලීම් බොහොමයක් සපුරාලිය නොහැකි වේ. එනම් රාජ්‍ය මූල්‍ය අංශය තවදුරටත් බරපතල හා සංකීර්ණ ගැටලුවලට මුහුණ දෙමින් සිටියි. එහෙයින්, වියදම් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට සියලු ප්‍රයත්නයන් දැරිය යුතු අතර, රාජ්‍ය මූල්‍ය අවකාශයේ සීමිත බව සහ හිඟ සම්පත් අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර වෙත යොමු කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, රජයේ වියදම් අරපිරිමැසුම්දායීව හා කාර්යක්ෂමව කළමනාකරණය කිරීම

ඉතා වැදගත් වේ. සමස්තයක් වශයෙන් ගත් කල, රාජ්‍ය මූල්‍ය සම්පත් ඉතා සැලකිලිමත්ව, මනා විනයකින් සහ වගවීමකින් යුතුව කළමනාකරණය කළ යුතු වේ.

1.4 ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ අරමුදල් පහසුකම් වැඩසටහන යටතේ වන සාර්ව ආර්ථික ගැලපීම් ඇතුළුව, රාජ්‍ය මූල්‍ය ඉලක්ක සහ රජයේ මැදි හා දිගු කාලීන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය මත පදනම්ව, 2024-2026 මධ්‍ය කාලීන රාමුව තුළ 2024 අයවැය සැකසීමට විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම මෙම චක්‍රලේඛයේ අරමුණ වේ. විශේෂයෙන්ම, ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමත් හරිත හා තිරසර වූ ඉහළ ආර්ථික වර්ධනයක් කරා රට මෙහෙයවීමත් සඳහා සැලසුම්කර ඇති සහ ප්‍රකාශයට පත් කර ඇති ප්‍රතිසංස්කරණ, කඩිනමින් ක්‍රියාත්මක කිරීම කෙරෙහි 2024 අයවැය මඟින් අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

## 2. 2024-2026 මැදිකාලීන සාර්ව ආර්ථික ගමන් මග

2.1 2048 වර්ෂයේදී ඉහළ ආදායම් ලබන රටක් බවට පත්වීමේ දිගුකාලීන ඉදිරිදැක්ම තුළ 2024-2026 කාල පරිච්ඡේදය ඇතුළත් මුල් වසර 5 තුළ දී ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවරත්වයට පත්ව, පූර්ණ වශයෙන් යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, සියලු රජයේ ආයතන විසින් තිරසාර හා ඉහළ ආර්ථික වර්ධනය වළක්වාලන ගැටළු සඳහා පිළියම් යොදන අතරම ආර්ථික ස්ථායීකරණය සහ යථා තත්ත්වයට පත්වීම තවදුරටත් තහවුරු කිරීම කෙරෙහි ඉවහල් වන ආර්ථික ප්‍රතිසංස්කරණ කෙරෙහි ද අවධානය යොමු කළ යුතු වේ.

2.2 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදල් පහසුකම් වැඩසටහන යටතේ වන මධ්‍යකාලීන සාර්ව ආර්ථික ඉලක්කවලට අනුව 2023 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් (ද.දේ.නි.යෙන්) සියයට 0.7 ක් බවට ඇස්තමේන්තු කර ඇති අයවැයෙහි ප්‍රාථමික හිඟය, 2026 වර්ෂයේදී ද.දේ.නි.යෙන් සියයට 2.3 ක අතිරික්තයක් දක්වා වර්ධනය කරගැනීමට නම්, 2024 වර්ෂයේදී එය ද.දේ.නි.යෙන් සියයට 0.8 ක අතිරික්තයක් දක්වා වර්ධනය කරගත යුතු වේ. ආදායම් ඉහළ නැංවීමේ සහ වියදම් තාර්කිකරණය කිරීමේ ප්‍රතිපත්තිවල සංකලනයෙන් මෙය සාක්ෂාත් කරගත යුතු වේ.

2.3 විවිධ හේතු මත, 2023 වසරේ මේ දක්වා රාජ්‍ය ආදායම් කාර්යසාධනය අපේක්ෂිත ඉලක්කයන්ට අනුකූල නොවන අතර ඒ හේතුවෙන් 2023 වසරේදී සැලකිය යුතු මට්ටමකින් රාජ්‍ය ආදායමේ අඩු වීමක් සිදු වනු ඇත. එබැවින්, ඉලක්කගත ප්‍රාථමික අයවැය ශේෂය කරා ළඟා වීම සඳහා රජයේ වියදම් විචක්ෂණශීලීව කළමනාකරණය කළ යුතු වේ. ඒ සඳහා දැඩි වියදම් පාලන ක්‍රියාමාර්ග අඛණ්ඩව අනුගමනය කරන අතරම ශුන්‍ය පාදක අයවැය ප්‍රවේශයකින් 2024 වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

## 3. 2024 වර්ෂය සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කිරීම

3.1 වැය දරන ආයතන විසින් ප්‍රමාණවත් අවධානයක් යොමු නොකරන ලද කරුණක් වූ "අවම යෙදවුම් තුළින් පරිවර්තනීය වෙනසක් සිදු කිරීම" යන්න 2024 වර්ෂය සඳහා අයවැය සැකසීමේදී ද සෑම රාජ්‍ය ආයතනයකම පොදු අරමුණ බවට පත් කර ගත යුතු වන අතර, වියදම් සම්බන්ධයෙන් සෑම විටම මුදලට සරිලන අගය (value for money) ජනිත වන බවට වගබලා ගත යුතු වේ.

3.2 එහිදී, රාජ්‍ය සේවා සැපයීමේදී ස්වයංක්‍රීයකරණය හා ඩිජිටල්කරණය, වියදම් පිළිබිඹුවන මිලකරණයක් හඳුන්වා දීම, ආදායම් පරිපාලනය කාර්යක්ෂම කිරීම, වියදම් අවම වන ලෙස රාජ්‍ය ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීම (Fiscal Consolidation) කෙරෙහි නිසි අවධානය යොමු කළ යුතු වේ.

3.3 රාජ්‍ය ආයෝජන සහ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන්, රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාවය ශක්තිමත් කිරීම හා පෞද්ගලික අංශය දිරිමත් කිරීම (ව්‍යාපාරික යෝජනා කැඳවීම), පුනර්ජනනීය බලශක්ති භාවිතය, නවීන තාක්ෂණය භාවිතය හා ඩිජිටල්කරණය සඳහා ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කළ යුතු වේ. එවැනි ව්‍යාපෘති ඇගයීමේදී ආයෝජන ධාරිතාව, රැකියා උත්පාදනය, අපනයන දායකත්වය, ආර්ථික දායකත්වය හා තිරසරභාවය යන නිර්ණායක සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු වේ.

3.4 සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ වන ඇස්තමේන්තු සකස් කිරීමේදී, දැනටමත් ආරම්භ කර ඇති ඩිජිටල්කරණ වැඩසටහන් හේතුවෙන් පරිපාලන වියදම් අවම වීම, සමාජ ආරක්ෂණ වැඩසටහන්වලදී සිදුවන

දූෂණය වැළැක්වීම හා ද්විකරණයන් මඟහැරීම තුළින් ජනිත වන වියදම් ඉතුරුවීම් නිරූපණය විය යුතු වේ. විවිධ සහනාධාර, සුභසාධන වැඩසටහන් හා සංවර්ධන සහායයන් යටතේ ප්‍රතිලාභ ලබාදීමේදී හැකිතාක් දුරට සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ දත්ත පද්ධතිය උපයෝගී කර ගත යුතු වේ.

3.5 රාජ්‍ය ව්‍යවසායන් මඟින් රාජ්‍ය අයවැයට ඇතිකරන අහිතකර බලපෑම අවම කිරීම සඳහා නිසි අවධානය යොමු කළ යුතු වේ. රාජ්‍ය ව්‍යසායන්හි කළමනාකරණ අකාර්යක්ෂමතා ඉවත් කිරීම හා දැනටමත් ආරම්භකර ඇති රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කිරීම තුළින් ඒවායේ දුර්වල මූල්‍ය පාලනය අවම කිරීම පිණිස මූල්‍ය විනය ශක්තිමත් කිරීම සඳහා පියවර ගත යුතු වේ.

3.6 අමාත්‍ය මණ්ඩල තීරණයක් මත පදනම්ව රාජ්‍ය අයවැයෙන් ඉහළම ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කරනු ලබන අමාත්‍යාංශ 10ක් සම්බන්ධයෙන් ශුන්‍ය පාදක අයවැයකරණ ප්‍රවේශයකින් (Zero-Based Budgetary Approach) වියදම් සමාලෝචනය කිරීම සඳහා රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු 10 ක් පත්කරන ලද අතර එම කමිටුවල නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙනු ඇත. ඒ අනුව, එම අමාත්‍යාංශ විසින් 2024 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සැකසීමේදී අදාළ රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු නිර්දේශවල සඳහන් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3.7 2024 අයවැය ඇස්තමේන්තු ශුන්‍ය පාදක අයවැයකරණ ප්‍රවේශයකින් (Zero-Based Budgetary Approach) සිදු කිරීමට යෝජිත බැවින් සියලුම වැය දරන ආයතන විසින් අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

i. ඒ ඒ අමාත්‍යාංශ වෙත පැවරී ඇති මූලික කාර්යභාරය ඉටුකිරීම සඳහා අදාළ වන කටයුතු පමණක් සිදු කිරීම හා අදාළ නොවන කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙන් ඉවත්වීම සඳහා ක්‍රමානුකූලව ඒවා නියමිත ආයතන වෙත පැවරීම.
ii. අමාත්‍යාංශ විසින් සෘජුව සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම වෙනුවට අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ දෙපාර්තමේන්තු හා ආයතන විසින්, සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.
iii. ආයතන තුළ, අංශ අතර හා හැකි සෑම අවස්ථාවකදීම ආයතන අතර සම්පත් බෙදා ගෙන (resource sharing) කටයුතු කළමනාකරණය කිරීමේ පරිසරයක් ඇති කිරීම .
iv. සංවර්ධන ව්‍යාපෘති යටතේ වන කාර්යයන් ආරම්භ කිරීමට ප්‍රථම, එම කටයුතුවලට සම්බන්ධව සේවා සපයන ආයතන (නිදසුන් ලෙස පළාත් ඉඩම් කොමසාරිස්, ප්‍රාදේශීය ලේකම්, ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ආදී) සමඟ බාධාවන් ඉවත් කරගැනීම සහ කඩිනමින් ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් සාකච්ඡා කර දැනුවත්වීම් හා පූර්ව එකඟතාවයන් ඇතිකර ගැනීමෙන් අනතුරුව කටයුතු ආරම්භ කිරීම අත්‍යවශ්‍ය වේ.
v. ඉතා ඉහළ පිරිවැයක් දරන දැවැන්ත ව්‍යාපෘති සඳහා පමණක් හෝ ඒවායේ ප්‍රතිඵල සහ කාර්යසාධනය සම්බන්ධයෙන් ස්වාධීන අධීක්ෂණ සහ ඇගයීම් සිදු කර අවශ්‍ය නිවැරදිකරණ ක්‍රියාමාර්ගවලට යොමු වීම.
vi. කාර්යයන් ද්විකරණය වන ආයතන/අංශ ඒකාබද්ධ කිරීම හෝ සමාන කාර්යයන් සිදුකරන සහ තවදුරටත් අවශ්‍ය නොවන ආයතන අහෝසි කිරීම.
vii. රටේ වර්තමාන තත්ත්වයන්ට ගැලපෙන පරිදි සියලුම සහනාධාර වැඩසටහන් සමාලෝචනය කර අත්‍යවශ්‍ය ප්‍රතිලාභීන් සඳහා පමණක් ප්‍රතිලාභ ගලායන පරිදි එම වැඩසටහන් ප්‍රතිසංවිධානය කිරීම හා ඒ සඳහා සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය සමඟ එක්ව කටයුතු කිරීම.
viii. ආයතන මට්ටමින් සේවක සංඛ්‍යාව පිළිබඳව ස්වයං සමාලෝචනයක් සිදු කිරීම, කාර්යයන් ද්විකරණය වන සහ තවදුරටත් අවශ්‍ය නොවන තනතුරු අහෝසි කිරීම, හැකිතාක් දුරට අදාළ ආයතනයේ මූලික කාර්යභාරය සඳහා පමණක් නිලධාරීන් යෙදවීම .
ix. සේවා සැපයීම් වෙනුවෙන් යාවත්කාලීන ගාස්තු අය කිරීම.

**4.** මීට අමතරව, පහත සඳහන් උපදෙස් පිළිපදිමින් 2024 වර්ෂය සඳහා වන වියදම් ඇස්තමේන්තු සැකසිය යුතු වේ.

### 4.1 මූලධන වියදම්

#### i. සංවර්ධන වියදම්

(අ). 2024 අයවැයට ඇතුළත් කරනු ලබන සංවර්ධන වියදම් සම්බන්ධයෙන් ඇමුණුම 1 හා 2 හි දැක්වෙන ආකෘතීන් මඟින් ඉල්ලා ඇති තොරතුරු සැපයීම අනිවාර්ය වේ.

(ආ). සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කිරීමේදී, ඒ ඒ උප-ව්‍යාපෘතිය යටතේ සම්මත වැය විෂයන්ට අනුව වෙන් වෙන්ව බෙදා ප්‍රතිපාදන ඇතුළත් කළ යුතු ය. නිදසුනක් ලෙස යම් ව්‍යාපෘතියකින් ගොඩනැගිලි ඉදිකිරීම්, යන්ත්‍ර මිල දී ගැනීම්, මෘදුකාංග සංවර්ධනය ආදිය සඳහා මුදල් යොදවන්නේ නම් අදාළ උප-ව්‍යාපෘතිය යටතේ එක් එක් කටයුතු සම්බන්ධයෙන් විශේෂිතව දක්වා ඇති සම්මත වැය විෂයන් අනුව ප්‍රතිපාදන බෙදා වෙන් කළ යුතු ය.

(ඇ). 2024-2026 මැදිකාලීන අයවැය රාමුව තුළ නව ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ප්‍රතිපාදන ඇතුළත් කිරීමට තරම් ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය අවකාශයක් නොමැති බැවින් නව ව්‍යාපෘති ඇතුළත් නොකළ යුතු වේ.

(ඈ). මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති නැවත ක්‍රමෝපායකරණය සහ වේගවත් කිරීමේ කමිටුව (Committee on Re-strategizing and Acceleration of Mega Projects – RAMP Committee) සහ ජාතික මෙහෙයුම් මැදිරිය (National Operation Room - NOR) මඟින් දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධයෙන් ලබා දී ඇති නිර්දේශ මෙන්ම එම නිර්දේශ මත පදනම්ව ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ කෙරෙහි ද දැඩි අවධානයක් යොමු කළ යුතු වේ.

(ඉ). අයවැය යෝජනාවක් ලෙස ආරම්භ කළ හෝ විදේශ මූල්‍ය සහාය මත ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල කාලය අවසන් වූ පසු එම ව්‍යාපෘති දේශීය අරමුදල් මඟින් තවදුරටත් පවත්වාගෙන යාමට ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු වේ.

(ඊ). පෞද්ගලික අංශයේ සෘජු ආයෝජන වශයෙන් හෝ රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා (Public Private Partnership - PPP) ආයෝජන වශයෙන් ශක්‍යතාවය සහිත ව්‍යාපෘති සඳහා ව්‍යාපාරික යෝජනා කැඳවීම දිරිමත් කරනු ලැබේ. එහිදී, ව්‍යාපෘතිවලින් උත්පාදනය වන ආදායම මඟින් වියදම් හැකිතාක් දුරට ආවරණය කර ගැනීමට හැකි ව්‍යාපාරික ආකෘති (business models) සකස් කර ගත යුතු වේ.

(උ). රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා ව්‍යාපෘතියක මුළු පිරිවැය, රජය මඟින් අදාළ පෞද්ගලික පාර්ශවය වෙත සිදුකරන වාර්ෂික ගෙවීම් (annuity payments) තුළින් පියවීමට යටත්ව සැලසුම් කරනු ලබන ව්‍යාපාරික ආකෘති සහිත ව්‍යාපෘති, ආරම්භ නොකළ යුතු වේ.

(ඌ) සංවර්ධන ව්‍යාපෘතිවලදී පුනර්ජනනීය බලශක්ති භාවිතය, නවීන තාක්ෂණය භාවිතය හා ඩිජිටල්කරණය යන අංශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.

(එ). රජයේ ප්‍රතිපත්තිමය මග පෙන්වීම මත ආරම්භ කළ යුතු නව ව්‍යාපෘති වේ නම්, අයවැය චක්‍රලේඛ අංක 03/2023 මඟින් දක්වා ඇති ක්‍රමවේදය යටතේ ජාතික සංවර්ධන කමිටුවේ නිර්දේශ සහිතව, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි නව ව්‍යාපෘති සඳහා පමණක් ප්‍රතිපාදන ඇතුළත් කළ යුතු වේ.

(ඒ). ණය නොගෙවීම මත නතර කර ඇති සංවර්ධන ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට අවශ්‍ය වන බැවින්, ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එවැනි ව්‍යාපෘතීන්හි වගකීම් සහ බැඳීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත සලසා දෙනු ලැබේ.

### ii. ආයතනික මූලධන වියදම්

(අ). අයවැය චක්‍රලේඛ අංක 03/2021 මඟින් රථ වාහන මිල දී ගැනීම සම්බන්ධයෙන් පනවා ඇති සීමා කිරීම් 2024 වර්ෂය සඳහා ද එලෙසම ක්‍රියාත්මක වේ.

(ආ). 2024 වර්ෂයේදී ද රාජ්‍ය ආයතන සඳහා නව ගෘහභාණ්ඩ, කාර්යාල උපකරණ හා උපාංග මිල දී ගැනීම හැකිතාක් සීමා කළ යුතු වේ.

(ඇ). මුද්‍රණ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර, පරිගණක වැනි උපකරණ තනි පුද්ගල/අංශ සඳහා වෙන වෙනම භාවිතා කිරීම වෙනුවට, අවම උපකරණ ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජනයක් ලබාගැනීමට හැකිවන පරිදි එවැනි උපකරණ සංචිතගත කර භාවිතයට ගත යුතු වේ.

(ඈ). ධාරිතා සංවර්ධනය යටතේ ඒකාබද්ධ අරමුදලින් ගෙවීම් කළ යුතු විදේශ පුහුණුවීම් සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු වේ. එවැනි පුහුණු අවශ්‍යතා, මාර්ගගත ක්‍රම (virtual methods) හා දේශීය ආයතන මඟින් සපුරා ගැනීමට කටයුතු කළ යුතු වේ.

(ඉ). දේශීය පුහුණුවීම් සඳහා ප්‍රතිපාදන ඇතුළත් කළ යුත්තේ සේවා ව්‍යවස්ථා, බඳවාගැනීමේ පටිපාටි සහ චක්‍රලේඛ විධිවිධාන මඟින් එවැනි පුහුණුවීම් නියම කර ඇත්තේ නම් පමණි.

### iii. නඩත්තු, පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්

නඩත්තුව, පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් සඳහා අත්‍යවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම පිළිබඳව නිසි අවධානය යොමු කිරීමට අවශ්‍ය වේ. ඒ අනුව, මූලධන ඇස්තමේන්තු සකස් කිරීමේ දී පවතින වත්කම් ආරක්ෂා කරගනිමින් ඒවායින් උපරිම ඵලදායීතාවයක් ලබාගනිමින් නිසි මහජන සේවා පවත්වාගෙන යාමට ප්‍රමුඛතාවය දිය යුතු වේ.

විශේෂයෙන් මහාමාර්ග, දුම්රිය මාර්ග, රෝහල්, පාසල්, ප්‍රධාන වේලි හා ජලාශ, වැව් අමුණු හා ඇල මාර්ග, වාරිමාර්ග නඩත්තු කිරීම් සඳහා නිසි නඩත්තු සැලැස්මක් යටතේ අවශ්‍ය වන ප්‍රතිපාදන නිශ්චිතව සඳහන් කර ඇස්තමේන්තු මඟින් වෙන්කර ගැනීම අවශ්‍ය වේ.

### iv. පළාත් සභා යාන්ත්‍රණය උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතා කිරීම

පළාත් සභා වෙත සෘජුව පැවරී ඇති කාර්යයන් සඳහා රේඛීය අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු යටතේ ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු වේ. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ප්‍රාදේශීය මට්ටමින් සිදුකරනු ලබන වැඩසටහන්/ව්‍යාපෘති පළාත් සභා වැඩසටහන්/ව්‍යාපෘති සමඟ ද්විකරණය වීම වැළැක්වීම සඳහා ඒවා සම්බන්ධයෙන් පළාත් සභා සමඟ සම්බන්ධීකරණය වී සැලසුම් සකස් කරගත යුතු වේ.

එසේම, පළාත් සභා යටතේ සැලකිය යුතු කාර්ය මණ්ඩලයකින් යුත් ආයතන පද්ධතියක් පවතින බැවින්, රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතනවල සේවා බෙදා හැරීම සඳහා හැකි සෑමවිටම පළාත්සභාවල එකඟතාවය මත එම ආයතන ව්‍යුහය යොදා ගත යුතු වේ.

## 4.2 පුනරාවර්තන වියදම්

පුනරාවර්තන වියදම් සඳහා ඇස්තමේන්තු පිළියෙළ කිරීමේ දී පහත සඳහන් කරුණු සලකා බැලිය යුතු වේ.

### i. වැටුප්, වේතන, අතිකාල සහ වෙනත් දීමනා

(අ). 2024 වර්ෂය තුළදී ද රාජ්‍ය සේවයට නව බඳවා ගැනීම් සිදු නොකරන බැවින්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කරනු නොලැබේ.

(ආ). 2023.06.30 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව පදනම් කරගෙන, 2024 වසර සඳහා වැටුප්, වේතන හා අනෙකුත් දීමනා ඇස්තමේන්තු, එක් එක් නිලධරයන් වෙනුවෙන් වෙන් වෙන්ව ගණනය කර, එම තොරතුරු ආයතන මට්ටමින් සකස් කර, ඇමුණුම 3 හි දක්වා ඇති ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතු වේ. පුද්ගල පඩිනඩි සඳහා වැය විෂය කේතය 1503 යටතේ අයවැය ප්‍රතිපාදන වෙන්කරන නිලධාරීන් පිළිබඳවද, මෙම ආකෘතිය අනුව එක් එක් ආයතනය සඳහා වෙන වෙනම විස්තර ද ඉදිරිපත් කළ යුතු වේ.

(ඇ). රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුතුව පත් කළ නිලධාරී කමිටුවේ නිර්දේශ අනුව එළැඹ ඇති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීම් සඳහා ප්‍රතිපාදන, බඳවාගැනීමේ ප්‍රගතිය අනුව ජාතික අයවැය දෙපාර්තමේන්තුව විමසා සලසා ගත යුතු වේ.

### ii. සංවර්ධන සහනාධාර හා සුබසාධන වියදම්

සුබසාධන වැඩසටහන් සම්බන්ධයෙන් පුළුල්ව සොයා බලා කටයුතු කිරීමට රජය විසින් තීරණය කර ඇති බැවින්, 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී යම් නීතියක් මඟින් හෝ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් සහිතව දෙනු ලබන සහනාධාර හැර ආයතන මට්ටමින් තීරණ ගෙන ක්‍රියාත්මක කරන කිසිදු සහනාධාරයක් හෝ සුබසාධන වැඩසටහනක් සඳහා ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු වේ.

### iii. නව පුනරාවර්තන වැය විෂයන් හා අයිතම කිහිපයක් හඳුන්වා දීම

වර්තමානය වන විට පවිත්‍රතා සේවා, ආරක්ෂක සේවා හා මෘදුකාංග නඩත්තු සඳහා දරන සමස්ත වියදම් සැලකිය යුතු අගයක් ගනී. එබැවින්, එම වියදම් අනාවරණය කිරීම සඳහා නඩත්තු වියදම් හා සේවා කාණ්ඩ යටතේ පහත පරිදි නව වැය විෂයන් 3ක් හඳුන්වා දී ඇත. පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු සැකසීමේදී එම වියදම් අදාළ නව වැය විෂය භාවිතා කරමින් ඉදිරිපත් කළ යුතු වේ.

**නඩත්තු වියදම්**

1304 - මෘදුකාංග නඩත්තු

**සේවා**

1405 - පිරිසිදු කිරීම් හා පවිත්‍රතා සේවා

1407 - ආරක්ෂක සේවා

මීට අමතරව, 1203-ආහාර හා නිල ඇඳුම් වැය විෂය සහ 1202-ඉන්ධන වැය විෂය යටතේ සියලු ආයතන පහත සඳහන් අයිතම භාවිතා කරමින් ඇස්තමේන්තු ඉදිරිපත් කළ යුතු වේ.

**1202 - ඉන්ධන**

| | | |
|---|---|---|
| | 002 | ඉන්ධන දීමනාව |
| | 009 | සංචිත වාහන සඳහා ඉන්ධන |
| | 010 | වෙනත් කටයුතු සඳහා ඉන්ධන |

**1203 - ආහාරපාන හා නිල ඇඳුම්**

| | | |
|---|---|---|
| | 001 | ආහාර |
| | 002 | නිල ඇඳුම් |

**1409 - වෙනත්**

| | | |
|---|---|---|
| | 138 | යන්ත්‍ර හා කාර්යාල උපකරණ සේවා ගිවිසුම් |
| | 139 | වාහන රක්ෂණය |
| | 140 | විවිධ සේවා වියදම් |

## 4.3. අත්තිකාරම් ගිණුම් කටයුතු

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සම්බන්ධ ඇස්තමේන්තු, ඇමුණුම 4 හි ලබාදී ඇති ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතු වේ. වාණිජ අත්තිකාරම් ගිණුම් පවත්වාගෙන යනු ලබන ආයතන විසින් ඒ සම්බන්ධයෙන් වන ඇස්තමේන්තු, ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් වන පරිදි සුදුසු ආකෘතියකින් ඉදිරිපත් කළ යුතු වේ.

## 4.4 තිරසර සංවර්ධන අරමුණු අනුව අයවැය ඇස්තමේන්තු සැකසීම

තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අවශ්‍ය නෛතික රාමුව 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත මඟින් නියම කර ඇත. 2030 වර්ෂය වන විට තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වෙන් කර ඇති ආකාරය හඳුනා ගැනීමට රජයේ අවධානය යොමු වී ඇත. එබැවින්, 2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු තිරසර සංවර්ධන ඉලක්කයන් සමඟ ගැලපීම අත්‍යවශ්‍ය වී ඇත.

තිරසර සංවර්ධන අරමුණු 17 සහ ඉලක්ක 169 ට අනුව වියදම් ඇස්තමේන්තු ගැලපීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා උපදෙස් අඩංගු වර්ගීකරණ මාර්ගෝපදේශය, තිරසර සංවර්ධන සභාව (Sustainable Development Council) විසින් නිකුත් කර ඇති අතර, එම වර්ගීකරණ මාර්ගෝපදේශය තිරසර සංවර්ධන සභාවේ https://sdc.gov.lk/ වෙබ් අඩවියෙන් බාගත කළ හැක. එම මාර්ගෝපදේශය අනුව හා තිරසර සංවර්ධන සභාවේ තාක්ෂණික සහය ද සහිතව ඔබ ආයතනයන් තුළ මෙම කාර්යය සඳහා දැනටමත් හඳුනාගෙන ඇති විශේෂිත නිලධාරීන් (SDG Focal Point Officer) මඟින් සියලුම අයවැයගත වියදම් වැඩසටහන් සහ ව්‍යාපෘතීන්, තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක සමඟ ගැලපීම් කිරීමට කටයුතු කළ යුතු අතර, එසේ සකස් කරන ලද අයවැය තොරතුරු, තිරසර සංවර්ධන සභාව වෙත, ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ද පිටපතක් සහිතව info@sdc.gov.lk යන ලිපිනයට මෘදු පිටපතක් ලෙස විද්‍යුත් තැපැල මඟින් ඉදිරිපත් කළ යුතුය.

තිරසර සංවර්ධන අරමුණු අංක 5 මඟින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා සියලුම කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම ඉලක්ක කර ඇති බැවින්, වාර්ෂික අයවැය සකස් කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය (gender responsive) කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.

## 4.5. ප්‍රතිපාදන ලබාදීමේ ප්‍රමුඛතා අනුපිළිවෙළ

පහත දැක්වෙන ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව ප්‍රතිපාදන ලබා දීම සිදු කරනු ඇත.

(අ). අත්‍යවශ්‍ය මහජන සේවා සහ නඩත්තු කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන
(ආ). වගකීම්/බැඳීම් නිරවුල් කිරීමට හෝ ගිණුම්ගත කිරීමට අවශ්‍ය වන ප්‍රතිපාදන
(ඇ). අවසන් කිරීමට ආසන්න වැඩ කොටස් අවසන් කිරීම
(ඈ). ආරම්භ කර ඇති ව්‍යාපෘති/ වැඩසටහන්වල ඊළඟ පියවර සඳහා ප්‍රතිපාදන

I. අර්ධ වශයෙන් නිමකර ඇති ව්‍යාපෘතිවල තීරණාත්මක කාර්යයන් පමණක් නිම කරමින් ඒවා පරිහරණය කළ හැකි තත්ත්වයට පත්කිරීම
II. අත්හිටුවීමට තීරණය කර ඇති ව්‍යාපෘතිවල දැනට සිදුකර ඇති කාර්යයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කටයුතු කිරීම
III. ව්‍යාපෘතිවල අනෙකුත් ඉදිරි පියවර සිදුකිරීම

(ඉ). ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම මත නැවත ආරම්භ කිරීමට සිදු වන විදේශ සහය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන

අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා දෙනු ලබන සියලුම ආයතන මෙම උපදෙස් පිළිපැදිය යුතු වේ.

## 4.6. වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

ඉහත කරුණු සලකා බලා නිසි පරිදි පිළියෙළ කරනු ලබන වියදම් ඇස්තමේන්තු අදාළ සියලුම උපලේඛනද සමඟ 2023 අගෝස්තු 23 වන දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතු වේ.

ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) හරහා වියදම් ඇස්තමේන්තු සඳහා 2024EXP_ES සැලසුම් පිටපත (version) ද, අත්තිකාරම් ගිණුම් ඇස්තමේන්තු සඳහා 2024ADV_ES සැලසුම් පිටපත (version) ද භාවිතා කරමින් ඉදිරිපත් කළ යුතු වේ. 2024-2026 වර්ෂ සඳහා වන මැදිකාලීන අයවැය ඇස්තමේන්තුව තුළ 2024 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සහ වර්ෂ 2025 සහ 2026 සඳහා වන පුරෝකථන අයවැය ඇස්තමේන්තු, මෙම මාර්ගගත පද්ධතිය ඔස්සේ ඇතුළත් කිරීම අනිවාර්ය වේ.

ඊට අමතරව, එම ලේඛනවල දෘඪ පිටපත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ මාණ්ඩලික නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු වේ. ITMIS පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සඳහා යම් සහායක් අවශ්‍ය වන්නේ නම්, දුරකථන අංක 011-2484999 හරහා ITMIS Helpdesk නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කළ යුතු වේ.

## 5. ආදායම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

ආදායම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ඇතුළත් චක්‍රලේඛයක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී නිකුත් කරනු ඇත.

## 6. පැහැදිලි කරගැනීම

මේ සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කර ගැනීමට අවශ්‍ය නම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ආයතනය පිළිබඳ වගකීම දරන විෂය භාර මාණ්ඩලික නිලධාරියා සම්බන්ධ කර ගැනීමට කටයුතු කළ යුතු වේ.

**කේ. එම්. මහින්ද සිරිවර්ධන**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත් : (i). ජනාධිපති ලේකම්
(ii). අග්‍රාමාත්‍ය ලේකම්
(iii). අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
(iv). විගණකාධිපති
(v). ලේකම්, මුදල් කොමිෂන් සභාව

## ප්‍රාග්ධන වියදම් යටතේ උප-ව්‍යාපෘති/අයිතම ලෙස ප්‍රතිපාදන වෙන්වන වියදම් ඇස්තමේන්තු පිළිබඳ විස්තර

**අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන වෙන්වන වැය විෂය විස්තරය[අ] | අනුමැතිය[ආ] | ව්‍යාපෘතියෙහි ආරම්භක වර්ෂය | ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත වර්ෂය | මුළු පිරිවැය ඇස්තමේන්තුව[ඇ] | 2023.07.30 දක්වා සමුච්චිත වියදම | 2023 වර්ෂයේ ඉදිරි කාලය තුළ අපේක්ෂිත වියදම | 2024 වර්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන | 2023.07.30 දිනට සමුච්චිත ප්‍රගතිය (භෞතික) | ඇස්තමේන්තුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | 2025 | 2026 |
| | | | | | | රු. මිලියන | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |

**සටහන්**

(අ). නව ව්‍යාපෘතියක් නම් “නව” ලෙස සඳහන් කරන්න

(ආ). අමාත්‍ය මණ්ඩල අනුමැතිය නම් අංක 1 ද, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු අනුමැතිය නම් අංක 2 ද, අයවැය යෝජනාවක් නම් අංක 3 ද යොදන්න

(ඇ). ව්‍යාපෘති සඳහා අමාත්‍ය මණ්ඩලය මගින් දැනට අනුමත කර ඇති මුළු පිරිවැය ඇස්තමේන්තුව සඳහන් කළ යුතු ය.

ඇමුණුම 02

**අයවැය ඇස්තමේන්තුව -2024**
**ව්‍යාපෘති සාරාංශය (සෑම සංවර්ධන ව්‍යාපෘතියක් සඳහාම සම්පූර්ණ කළ යුතුය )**

1 **වැය ශීර්ෂය හා අංකය**
2 **උප-ව්‍යාපෘතියේ නම සහ අංකය**
3 **වැය විෂය විස්තර**
4 **අනුමැතියේ ස්වභාවය (කරු. සටහන් 2 බලන්න)**

5 **ව්‍යාපෘති අරමුණු**
(කෙටියෙන් පේළි 3 - 5 ක් ඇතුලත)

6 **කාර්යය ලේඛණය (ලැයිස්තුව)**
(කාර්යයන් 5 - 10 ක් කෙටියෙන් හඳුන්වන්න)
1
2
3
4
5

7

| **ව්‍යාපෘති දර්ශක** | **2022** | **2023** | **2024** | **2025** | **2026** |
|---|---|---|---|---|---|
| කාර්යසාධක දර්ශක | | | | | |
| 1 | | | | | |
| 2 | | | | | |
| 3 | | | | | |
| 4 | | | | | |
| 5 | | | | | |
| | | | | | |
| **පිරිවැය (රු. මිලියන)** | **2022** | **2023** | **2024** | **2025** | **2026** |
| **පුනරාවර්තන වැය** | | | | | |
| පුද්ගල පඩිනඩි | | | | | |
| වෙනත් පුනරාවර්තන ස්වභාවයේ වියදම් | | | | | |
| **මූලධන වැය** | | | | | |
| දේශීය මූල්‍යකරණය (සංකේතය 11 සහ 17) | | | | | |
| විදේශීය මූල්‍යකරණය (සංකේතය 12, 13, 14, 15 සහ 16) | | | | | |
| **එකතුව** | | | | | |

8 **ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩල විස්තර**

| **අනු අංකය** | **තනතුර** | **සංඛ්‍යාව** |
|---|---|---|
| | | |
| | | |
| | | |

9 **ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සතු වාහන පිළිබඳ විස්තරය**

| **වාහන වර්ගය** | **සංඛ්‍යාව** |
|---|---|
| කාර් | |
| ජීප් රථ | |
| ඩබල් කැබ් රථ | |
| වෑන් රථ | |
| බස් රථ | |
| ත්‍රී රෝද රථ | |
| යතුරු පැදි | |
| වෙනත් | |

**සටහන්**

1 දැනට කාල නියමයන් නිශ්චය කර නොමැතිව වාර්ෂිකව ප්‍රතිපාදන වෙන්කර ගැනීම් යටතේ දරනු ලබන වියදමක් නම් අදාල කටයුත්ත පිළිබඳ යළි විමර්ශනය කර ඉලක්ක සකස්කර අවසන් කිරීමට දින නියමකර ගත යුතුය

2 අනුමැතියේ ස්වභාවය - ව්‍යාපෘතිවල මුළු පිරිවැය අනුව, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හෝ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා තිබිය යුතු ය. නැතහොත් අයවැය යෝජනාවක් ලෙස නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගෙන තිබිය යුතු ය. ඒ අනුව, අදාල අමාත්‍ය මණ්ඩල තීරණයේ හා/හෝ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තු ලිපියේ දිනය හා අංකය සඳහන් කළ යුතු වේ. අයවැය යෝජනාවක් නම් අදාල වර්ෂය සහ යෝජනාවේ අංකය සඳහන් කළ යුතු ය.

**ඇමුණුම 03**

**(අ) කොටස**

**2024 වර්ෂය සඳහා වැටුප්, වේතන හා වෙනත් දීමනා (එක් එක් අයවැය ව්‍යාපෘතිය සඳහා වෙන වෙනම ආකෘති ඉදිරිපත් කරන්න )**

| අනු අංකය | නනතුර | නම | වැටුප් කේතය | ස්ථිර/තාවකාලික | 1001 | 1003 | | | | | | 1202 | 1401 | 1402 | මාසික වැටුප් හා දීමනා එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2024 වර්ෂයට අදාළ වැටුප් වර්ධකය සහිත මාසික මූලික වැටුප | මාසික ජීවන වියදම් දීමනාව | මාසික රු. 5000/= දීමනාව | මාසික විධායක දීමනාව | මාසික භාෂා දීමනාව | මාසික විශේෂ ගැලපුම් දීමනාව | මාසික වෙනත් දීමනා (එක් එක් දීමනාව වෙන වෙනම දක්වන්න) | මාසික ඉන්ධන දීමනාව | මාසික ප්‍රවාහන දීමනාව | මාසික දුරකථන දීමනාව | |
| | | | | | (රුපියල්) | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | | | | |

**(ආ) කොටස**

**කාර්ය මණ්ඩල තොරතුරු**

| | අනුමත/තතනය කාර්ය මණ්ඩලය (2023.06.30 දිනට) | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | වෙනත් | | එකතුව | |
| | I වන පංතිය සහ අධි ශ්‍රේණිය | | II වන සහ III වන පංතිය | | | | | | | | | | | |
| | අනුමත | තතනය | අනුමත | තතනය | අනුමත | තතනය | අනුමත | තතනය | අනුමත | තතනය | අනුමත | තතනය | අනුමත | තතනය |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

**2024 වසර අයවැය සඳහා අත්තිකාරම් ගිණුම් කටයුතු**
**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු**

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම:
අත්තිකාරම් ගිණුමේ අංකය:

| | | | | |
|---|---|---|---|---|
| 2023.06.30 දිනට ස්ථිර සේවක සංඛ්‍යාව | | xxx | | |
| 2023.06.30 දිනට කොන්ත්‍රාත් සහ අනියම් සේවක සංඛ්‍යාව | | xxx | | |
| සම්පූර්ණ සේවක සංඛ්‍යාව | A | xxx | | |
| | | | | |
| **උත්සව හා විශේෂ අත්තිකාරම්** | | | | |
| එක් සේවකයෙක් සඳහා උත්සව හා විශේෂ අත්තිකාරම් (10,000+4,000) | | | 14,000 | |
| උත්සව හා විශේෂ අත්තිකාරම් සඳහා අවශ්‍ය මුළු ප්‍රතිපාදන **(A x 14,000)** | B | | **xxxxx** | |
| | | | | |
| **ආපදා ණය** | | | | |
| ජ්‍යෙෂ්ඨ / තෘතීය / ද්විතීය මට්ටමේ සේවකයින් සංඛ්‍යාව | C | | xxxx | |
| ජ්‍යෙෂ්ඨ / තෘතීය / ද්විතීය මට්ටමේ සේවකයෙක් සඳහා ආපදා ණය | | | 250,000 | |
| | | | | |
| ජ්‍යෙෂ්ඨ / තෘතීය / ද්විතීය මට්ටමේ සේවකයන් සඳහා ආපදා ණය වෙනුවෙන් අවශ්‍ය මුළු ප්‍රතිපාදන **( C x 250,000)** | D | | **xxxxx** | |
| | | | | |
| ප්‍රාථමික මට්ටමේ සේවකයන් සඳහා මාසික මුළු මූලික වැටුප් | E | | xxxx | |
| ප්‍රාථමික මට්ටමේ සේවකයන් සඳහා ආපදා ණය වෙනුවෙන් අවශ්‍ය මුළු ප්‍රතිපාදන **( E x 10)** | F | | **xxxxx** | |
| | | | | |
| මුළු ප්‍රතිපාදන අවශ්‍යතාව **( B+D+F)** | | | | xxxxxxx |
| 2023.06.30 දිනට අත්තිකාරම් "බී" ගිණුමේ හර ශේෂය | | | | (xxxxxx) |
| 2023.06.30 දිනට අත්තිකාරම් "බී" ගිණුමේ පවතින ඉතිරි ප්‍රතිපාදන | | | | (xxxxxx) |
| ණය අත්තිකාරම් ගෙවීම සඳහා තවදුරටත් අවශ්‍ය ප්‍රතිපාදන | G | | | xxxxxxx |
| | | | | |
| | | | | **යෝජිත ගණන්** |
| **2024 වසර සඳහා උපරිම වියදම් සීමා ප්‍රතිපාදන අවශ්‍යතාව** | G | | **xxxxxxx** | **xxxx** |
| | | | | |
| 01.01.2023 – 30.06.2023 කාලය සඳහා මුළු ලැබීම් | | | xxxx | |
| මසකට ලැබීම් සාමාන්‍යය | | | xx | |
| 2023 වසර සඳහා අපේක්ෂිත මුළු ලැබීම් | | | xxxx | |
| | | | | |
| **2024 වසර සඳහා අවම ලැබීම් සීමා ප්‍රතිපාදන අවශ්‍යතාව** | | | | **xxxx** |
| | | | | |
| 2023.01.01 දිනට අත්තිකාරම් "බී" ගිණුමේ ශේෂය | | | xxxxx | |
| 2023 වසර සඳහා අපේක්ෂිත මුළු වියදම | | | xxxx | |
| 2023 වසර සඳහා අපේක්ෂිත මුළු ලැබීම් | | | (xxxxxx) | |
| 2023.12.31 දිනට අපේක්ෂිත ශේෂය | | | xxxxxxx | |
| | | | | |
| 2024 වසර සඳහා අවශ්‍ය වියදම | | | xxxxxxx | |
| 2024 වසර සඳහා අවශ්‍ය ලැබීම් | | | (xxxxxx) | |
| **2024 වසර සඳහා උපරිම හර ශේෂ සීමා ප්‍රතිපාදන අවශ්‍යතාවය** | | | **xxxxxxx** | **xxxxxx** |

දිනය: ...........................

...........................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන